# පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය

## ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර සපයන

## මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩි දියුණුකිරීම ආයෝජන වැඩසටහන (අදියර 3)

## සහ මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි ඇ. ඩො. මිලියන 112.83 ක වියදමින් මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන කොළඹ හා දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශ සහ කොලොන්නාව නගර සභා බල ප්‍රදේශ ඇ. ඩො. මිලියන 116.1 ක වියදමින් මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වඩා හොඳ අපජල කළමනාකරණ සේවාවක් ලබා දීමෙන් මහ කොළඹ නගරවාසීන්ගේ මහජන සෞඛ්‍ය සහ නාගරික පරිසරය සංවර්ධනය කිරීමයි.

මෙම ව්‍යාපෘති කොළඹ මහා නගර සභාව මගින් ක්‍රියාත්මක කරන අතර, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබයි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත තනතුරු සඳහා අදාළ සුදුසුකම් සහිත පුද්ගලයන් 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව බඳවා ගැනීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

**මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහනේ තනතුරු :**

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම | වැටුප් තලය + රජයේ අනුමත අනෙකුත් දීමනාවන් |
|---|---|---|---|---|
| 1 | ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 02 | පීඑස් 4 | රු.135,000.00- රු.150,000.00 |
| 2 | ව්‍යාපෘති ඉංජිනේරු (පුහුණු) | 01 | පීඑස් 4 | රු.135,000.00- රු.150,000.00 |
| 3 | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 03 | පීඑස් 5 | රු.95,000.00- රු.103,000.00 |

## (1) ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) - තනතුරු - 02

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධිය

**හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් මගින් පවත්වනු ලබන ශක්‍යතාවය පිළිබඳ මධ්‍යම මට්ටමේ විභාගය සමත් වීමෙන් පසු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද

**සහ**

2. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවේ III/II පන්තියේ නිලධාරියකු ලෙස හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන මට්ටමේ තනතුරක සේවය කර තිබීම **සමඟ** අවම වශයෙන් II/III පංතියේ තනතුරක වසර 09 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි සහ අපජල කළමනාකරණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (2) ව්‍යාපෘති ඉංජිනේරු (පුහුණු) - තනතුරු - 01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක් මගින් පවත්වනු ලබන ශක්‍යතාවය පිළිබඳ මධ්‍යම මට්ටමේ විභාගය සමත් වීමෙන් පසු අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද

**සමඟ**

2. ශ්‍රී ලංකා දීප ව්‍යාප්ත සේවාවේ III/II පන්තියේ නිලධාරියකු ලෙස හෝ පුහුණු ක්ෂේත්‍රයේ සමාන මට්ටමේ තනතුරක සේවය කර තිබීම සමඟ අවම වශයෙන් II/III පන්තියේ තනතුරක වසර 09 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි සහ පුහුණු ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (3) සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) - තනතුරු-03

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධිය

**හෝ**

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු කෝෂ්ත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය කෝෂ්ත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද

**හෝ**

2. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු කෝෂ්ත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 6) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු විෂය කෝෂ්ත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද

**හෝ**

3. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු කෝෂ්ත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 5) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු කෝෂ්ත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි සහ අපජල කළමනාකරණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ තනතුරු.**

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම | වැටුප් තලය + රජයේ අනුමත අනෙකුත් දීමනාවන් |
|---|---|---|---|---|
| 1 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්) | 01 | පීඑස් 2 | රු.165,000.00- රු.185,000.00 |
| 2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | පීඑස් 2 | රු.165,000.00- රු.185,000.00 |
| 3 | කොන්ත්‍රාත් කළමනාකරු | 01 | පීඑස් 3 | රු.160,000.00- රු.175,000.00 |
| 4 | ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | පීඑස් 3 | රු.160,000.00- රු.175,000.00 |
| 5 | මූල්‍ය කළමනාකරු | 01 | පීඑස් 3 | රු.160,000.00- රු.175,000.00 |
| 6 | ව්‍යාපෘති නිලධාරී (මෙහෙයුම් හා ඇගයුම්) | 01 | පීඑස් 5 | රු.95,000.00- රු.103,000.00 |
| 7 | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 03 | පීඑස් 5 | රු.95,000.00- රු.103,000.00 |
| 8 | සහකාර ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | පීඑස් 6 | රු.62,000.00- රු.67,000.00 |
| 9 | කළමනාකරණ සහකාර | 02 | සහාය කාර්ය මණ්ඩලය | රු.22,960/- සහ මූලික වැටුපෙන් 50% |
| 10 | රියදුරු | 01 | | රු.17,980/- සහ මූලික වැටුපෙන් 50% |

## (1) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්) - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක් **සමඟ** උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 13 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමඟ** විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 11 ක පළපුරුද්ද
3. දීප ව්‍යාප්ත සේවයන්ගේ පළමු පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම **සමඟ** වසර 10 ක් පළමු පංතියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි මෙහෙයුම් හා ඇගයුම් පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (2) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක් **සමඟ** උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 13 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමඟ** විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 11 ක පළපුරුද්ද
3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවේ පළමු පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම **සමඟ** වසර 10 ක් පළමු පංතියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි සහ අපජල කළමනාකරණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (3) කොන්ත්‍රාත් කළමනාකරු - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක් **සමඟ** උපාධිය සම්පූර්ණ කළ පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වීම අනිවාර්යය වේ.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමඟ** විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් පශ්චාත් උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 10 ක පළපුරුද්ද
3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයන්ගේ පළමු පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම **සමඟ** අවම වශයෙන් වසර 09 ක් පළමු පංතියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම.

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි සහ අපජල කළමනාකරණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (4) ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක් **සමඟ** උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමඟ** පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 10 ක පළපුරුද්ද
3. දීප ව්‍යාප්ත සේවයන්ගේ පළමු පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම **සමඟ** වසර 09 ක් පළමු පංතියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (5) මූල්‍ය කළමනාකරු - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක් **සමඟ** උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමඟ** පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 10 ක පළපුරුද්ද
3. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයන්ගේ පළමු පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම **සමඟ** වසර 09 ක් පළමු පංතියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතීන්හි මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (6) ව්‍යාපෘති නිලධාරී (මෙහෙයුම් හා ඇගයුම්) - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක්

**හෝ**

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද විෂය කෝෂ්ත්‍රයට අදාළව ජාතික වෘත්තීය නිපුණතා (NVQ 7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය කෝෂ්ත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද

2. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද විෂය ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය නිපුණතා (NVQ 6) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද

3. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද විෂය ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය නිපුණතා (NVQ 5) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතින්හි මෙහෙයුම් හා ඇගයම් පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (7) සහකාර ව්‍යාපෘති ඉංජිනේරු(සිවිල්) - තනතුරු-03

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධිය

**හෝ**

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

2. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 6) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

3. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 5) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතින්හි සහ අපද්‍රව්‍ය කළමනාකරණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (8) සහකාර ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාලව ලබා ගත් උපාධිය

**හෝ**

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

2. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 6) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද

3. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය නිපුණතා (NVQ 5) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කළ පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද

- විදේශීය මූල්‍යාධාර සපයන ව්‍යාපෘතින්හි මූල්‍ය කළමණාකරන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට හැකි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (9) කළමනාකරණ සහකාර - තනතුරු 02

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව අවම වශයෙන් විෂයන් 06ක් සමත්වීම **සහ** අ. පො. ස. (උ. පෙළ) විභාගයේ විෂයන් 03ක් සමත්වීම **සහ** ගිණුම්කරණය සහ කාර්යාල කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද

- විදේශ මූල්‍යාධාර සපයන ව්‍යාපෘතින්හි පළපුරුද්ද සහ සිංහල පරිගණක යතුරු ලියනය, පරිගණක භාවිතය පිළිබඳ දැනුම සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට හැකි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## (10) රියදුරු - තනතුරු-01

**අධ්‍යාපන සුදුසුකම් :**

අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වීම

**වෘත්තීය සුදුසුකම් :**

1 පෞද්ගලික/කුලී රථ සහ බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම

(බඳවා ගන්නා දිනට වසර තුනකට (03) පෙර අවම වශයෙන් සී (C) සහ සී1 (C1) වාහන පන්තියේ බලපත්‍රය අනුව බී (B) පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය)

2 මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

**පළපුරුද්ද :**

- රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.

**කායික සුදුසුකම් :**

- අවම උස අඩි පහක් විය යුතුය.
- දිවා සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.

## පොදු කොන්දේසි :

- **වයස :** අවුරුදු 65 ට අඩුවිය යුතුය. (2018-06-23 දිනට)
- සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් ප්‍රතිශතය මාසික වැටුපෙන් 8%ක් ද, සේවායාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ ප්‍රතිශතය 12%ක් ද, සේවක භාරකාර අරමුදල් ගෙවීම 3%ක් ද වේ.
- **සේවා කොන්දේසි :** සියලුම බඳවා ගැනීම් මූලික වශයෙන් එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, ව්‍යාපෘති කාල සීමාව, තනතුරේ අවශ්‍යතාවය සහ සතුටුදායක කාර්ය සාධනය මත සේවා කාලය වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී.

රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන් සිය අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු අදාළ අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් සමග **ලේකම්, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 ලිපිනයට 2018-07-13** වන දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ව්‍යාපෘතියේ නම සහ ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**ලේකම්.**
**පළාත් සභා,**
**පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය**
**23-06-2018**